

## සන්ධ්‍යා තීර්ථය

රත්න ශ්‍රී විජේසිංහ



උදම් වෙයි මහ මුහුද වැතිර ඉන්නී වෙරළ
කොට්ටම්බ අතුපතර කණාමැදිරි කෙළිමඩල
නොතකාම වට අවට ඝණ අඳුර කැලි කසල
පෙම්වත්තු සැරි සරති පටු අඳුරු මග අසල

හැරී ආ පසු බලමි මා පැමිණි පිය හසර
මැකී යයි අතීතය සුදෝ සුදු පෙණ වැළඳ
කොහේ හෝ නන්නාඳුනන බිමක දුරු කතර
ඔබත් ඇති මා වගෙම සිහින සිතිවිලි අතර

අත්ලිහී අත ඇඟිලි දුරස් වී යන අතර
හඬන්නට ආසන්න මලානික මුවමඩල
මට පෙනේ දෙබෑ කොට හඬ නඟන රළ පතර
මැකී යනු නැත කැරලි ගැසූවත් මහ මුහුද

අයිති කරගෙන නැතිදු සදාකල් ඔවුනොවුන
වැළඳ ඉන්නේ නොවෙද අහස හා මහමුහුද
සිතිජයේ තනි ඇඳක කොටු මදුරු දැල් නැතිව
නිදන උන් වටා මුරකරයි නෙත් දස දහස

ප්‍රදීපාගාරයේ කවුළුවෙන් බිම වැටෙන
පාලමකි දේදුන්න ඔබ හිඳින ලෝකයට
එතෙර හෝ මෙතෙර ගැන කිසි හැඟීමක් නැතිව
රැකෙෂන්නට වරම් දෙන්නේ කවුද මගියෙකුට

ඔබ ඈත ආකහේ චන්ද්‍ර බිම්බය වෙන්න
හෙමන් හොර රහසේම ඉහ උඩින් පායන්න
දැල්වේවි අප වටා තාරකා සෑහෙන්න
එතකොටම හැමෝටම මතක් වෙයි රෑ වෙන්න

අඳුර නම් අඳුරමය කියා එදවස කීවද
එය එසේ නොවන වග දැනෙයි රැය අභියසට
මට මගේ අඳුර අඳුරක් නොවන බව කියන
ඔබ ඉන්න දැල්වෙමින් අහසේම තරු අතර

*සන්ධ්‍යා තීර්ථය* 2010



## වෑයම

එරංගා පෙරේරා

යන්නමයි
වැර වෑයම
මද සුළගටත්
ඈතටම ගසාගෙන

ඉතින් කොහොමද
සූළි සුළඟක්
ආවොතින්

දෑතක් ඇතිවෙයිද
නික්මී නොගොස්
වෑයමින්
නැවතෙන්න

## ඔය ආදරයයි සියල්ලටම වඩා වටින්නේ

තුෂාරි ප්‍රියංගිකා

කිරි ඉද්ද පිපී හිනැහෙන හැටි බලන්න එන්න
නා දල්ල දිගේ බේරෙන පිනිකැට අහුලන්න
සියපතක දිලෙන මුදු ගුණ දෑසක තවරන්න
මගෙ පුංචි දුවේ ගහ කොළ දියවැල් ය බලන්න

නිල් අහස දිගේ පියඹන සියොතුනි මෙහෙ එන්න
කිරි ගොයම පැසී එක කවියක් කියලා යන්න
මහපොළොව හිඳී නොසැළී නුඹලා සනසන්න
මගෙ පුංචි පුතේ පුන් පෝ දා අහස බලන්න

දයා දියෙන් තෙමෙනා හදවතක් තියෙන්න
ආදරයෙන් සොබා දහම දිහා බලන්න
මගෙ පුංචි දරුවනේ වසවිස ගැනත් හිතන්න
ගන අඳුරු රැයට පහනක් සේ රැස් විහිදන්න

පුංචි ලොවක පුංචි එවුන් වගේම ඉන්න
කුරුළු පැටවුනේ පියඹා ලෝකෙ දකින්න
අකුර අකුර එකතු කරලා නැණස වඩන්න
සොඳුරු ලොවක් තැනුමට නම් නුඹලට ඉන්න

නිල් මැණික පරද්දන එළියකි දැනුම කියන්නේ
ඒ එළියෙනි මිනිසත්කම පාට වැටෙන්නේ
කිරි හිනාවකින් කලතා ලෝකෙට කියපන්නේ
ඔය ආදරයයි සියල්ලටම වඩා වටින්නේ

## වඳු දළදා පෙරහැර බැති පෙමිනී

සුනිල් සරත් පෙරේරා



සෙංකඩගල කඳුකර රජ දහනේ
දෙව් පුර සිරි දෙයි ඇසල උදානේ
පොබකළ උරුමය දෑ අබිමානේ
වඳු දළදා පෙරහැර සඳ පානේ

සට සට කස නද දී අතනෑර
මුලටම සිටි පිරිසකි කසකාර
කන්කළු ගී රැව් දෙති මනහාර
පසතුරු ගොස අතරේ කවිකාර

ඇතුනගෙ දිලිසෙයි නෙත්තිය මාලේ
පන්දම් එලිවැට දැල්වෙන ලීලේ
හෙලමින චාමර මල්දම් මාලේ
තේවා කරවයි කරඬුව දෑලේ

සුළඟේ දැවටී දුර කඳු අතරේ
තම්මැට හොරණෑ නාදය පැතිරේ
මිහිදුම් දුහුලේ සඳ රැස් දහරේ
රන්කොත දිලිසේ දළදා මැදුරේ

පයට සිලම්බුව දල කොපු රැන්දූ
කරඬුව වඩමයි ඇතු මන බැන්දූ
ගැයවෙයි ගජගා වන්නම් සින්දූ
ලාලිත ගමනට සිව්පා රැන්දූ

## පිය ළඳුනේ

සාගරයකි ඔබ තරණය කරනු බැරී
ප්‍රහේලිකාවකි විසඳාගන්න බැරී

සිනාසෙන ඔබ කඳුළකී
නිමානොවෙනා සුසුමකී
මගේ හදවත සදා රිදවන
ලියා නොගැයෙන ගීයකී

කඳුළු අතරට මදහසයි
අඳුරු අහසක එලි තිතයි
සොඳුරු මතකය ඉබේ හඬවන
දෙනෙත අඳ කළ රුව ඔබයි

මෛත්‍රී පනාගොඩ



## අද මහ ගෙදර

ගමමැද පිහිටි සුවිසල් මැදුර මනහර
ආ ගිය දනන් ගෙන් නිම නැති විය නිතර
සිටු නිවසකට සම විය හිමි දන පවර
අග හිඟ නොවිඳි රසමසවුළු මහ ගෙදර

යල මහ පැසී එන අස්වනු නොවේ නිම
තල කුරහනින් සරුසාරය වේනෙ බිම
ලියලා වැඩෙයි වැල් බුලත ද ගෙපල ඉම
විසිතුරු වඩයි මල් වට බිගු කරන පෙම

බාලේ පටන් රැස් කොට සුරැකුනු දනය
සපුරා සව් ඉසුරු කලෙළ සැප වින්දනය
විය අවදියේ දූ දරු මන නන්දනය
සකලයි මෙ සැම එයි සැප වියැකෙන දිනය



පෙළවහ සැදී ගිය පසු දූ වරු පිටට
බාළ ම පුතුය සෙව්වේ දෙමහළු සතුට
කාලය ගෙවද්දී මෙලෙසින් පුතු අවට
යෙදුනා පෙළවහක පුතු නොදැමුනු කමට

දෙමහළු සතුට යයි පාවී ගුවන අරා
නොසතුට අඬ දබර නිම නැත නිවස පුරා
පෙරසේ යනෙනු නැත කිසි මහ ගෙදර කරා
ඉසුරෙහි සිරිය ඇත වියපත් බවට නෙරා

නොසැලු අසු විරෙය කඳුලින් දෑස තෙමී
වියැලී ගියා සිත් පිත් හා දනයෙ ඉමී
ළං ළං වේදිත මව්පියා මරු වසඟ නැමී
පාළුව අඳුර මුසු වා මහ ගෙදර හැමී

දහසක් දෙනා ආ ගිය මහ ගෙදර අද
පාරක් නොමැති නිවසකි ඉඩකඩම් මැද
වහලේ කොණක් එයි පහළට ඉහළ ඉද
කාලය මහළු වෙයි ගේදොර සෙවල බැද

පබැදුම
**හෙන්රි කුමාරප්පෙරුම**
ඇඹිලේඩි සිට